පහත සඳහන් සභාපතිතුමියගේ පණිවුඩය වාර්ෂික වාර්තාවේ පිටු අංක 16 - 20 හි ඇති සභාපතිතුමියගේ පණිවුඩයේ පරිවර්තනයක් පමණි.

## සභාපතිතුමියගේ පණිවුඩය

HNB ඇෂුවරන්ස් සමාගමේ දහහතර වන වාර්ෂික මහා සභා රැස්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඔබ සැම දෙනා සාදරයෙන් පිළිගැනීමටත් 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා ගිණුම් වාර්තාව මේ සමග ඉදිරිපත් කිරීමටත් ලැබීම මට ඉමහත් සතුටකි. ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සමාගම් දෙකක් ලෙස බෙදා වෙන්කිරීමත් සමඟ ගෙවුනු පළමු වර්ෂය වන 2015, අභියෝගාත්මක වර්ෂයක් බවට සඳහන් කළහැක.

<u>ආර්ථිකය</u>

2010 වර්ෂයට පදනම්ව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2015 වසර තුළ 5.5% ක වර්ධනයක් පෙන්නුම්කර ඇත. මේ සඳහා කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනයත්, මූලික වශයෙන්ම වී වගා ක්ෂේත්‍රය ඇතුලත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සතුටුදායක කාර්ය සාධනයත්, සේවා අංශයේ මධ්‍යම වර්ධනයත් හේතු වී ඇත.

අර්බුදකාරී වූ ගෝලීය ආර්ථිකයක් තුළ දේශීය ආර්ථිකය වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විවිධ ක්‍රමවේද යොදාගනිමින් පොළී අනුපාත පහළ අගයක තබා ගැනීමට කටයුතු කර ඇත. එනමුත් උද්ධමන ආර්ථිකයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා 2012 වර්ෂයේ සිට අනුගමනය කරන ලද ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තීන්, 2015 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට දැඩි කිරීමට පියවර ගන්නා ලදී. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමන අනුපාතිකය තනි අගයක පැවති අතර ගෝලීය මිලෙහි වෙනස්වීම හේතුවෙන් දේශීය බලශක්ති මිල ගණන් අඩුවීම හා සැපයුම් තත්වයන් හේතුවෙන් උද්ධමන අනුපාතය 1% වඩා පහත යාමක්ද සිදුවිය.

රාජ්‍ය සේවක වැටුප් වර්ධනය හේතුවෙන් ඇතිවූ වැයකළහැකි ආදායමේ ඉහළ යාමත් ලිහිල් ණය ගැනීම් රෙගුලාසිත් හේතුවෙන් රථ වාහන ආනයනය සඳහා වූ ඉල්ලුම ඉහළයාමක් සිදුවිය. මෙම ප්‍රවණතාව හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ වලට ඇති ඉල්ලුමත් සමඟ ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති වීම ද සිදුවිය. නිෂ්පාදන සහ කාර්මික ක්ෂේත්‍රවල වර්ධනය අරමුණු කරගෙන රජය විසින් නොවැම්බර් මාසයේ ඉදිරිපත් කළ අයවැයෙන් ලබාදුන් සහන හේතුකොටගෙන විදේශ ආයෝජන දිරිගැන්වීමක් මෙන්ම සේවා අංශයේ වර්ධනයක් ද ඇති විය.

කෙසේ වෙතත් ආර්ථිකයේ සියළුම ක්ෂේත්‍රවල පූර්ණ උපයෝගීතාවය ලබා ගැනීම සඳහා රජයට දිගු කාළීනව තිරසාර සංවර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සිදු වනු ඇත .

<u>රක්ෂණ කර්මාන්තය</u>

ජීවිත රක්ෂණ අංශයේ වර්ධනය 20% ක් ද සාමාන්‍ය රක්ෂණ අංශයේ වර්ධනය 15% ක්ද සමගින් 2015 වසර තුළදී රක්ෂණ කර්මාන්තය මධ්‍යම ප්‍රමාණයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සාමාන්‍ය රක්ෂණ අංශයේ පිරිවැටුම රු. බිලියන 67 ක් සහ ජීවිත රක්ෂණ අංශයේ පිරිවැටුම රු. බිලියන 53 ක් වූ අතර මුළු පිරිවැටුම රු. බිලියන 120 ක් ලෙස වාර්තා වී ඇත. ආයතන කිහිපයක් වෙළෙඳපොල වැඩි කොටසකට හිමිකම් කියන අතර කුඩා පරිමාණ රක්ෂණ සමාගම් සුවිශේෂී නිෂ්පාදන හා සේවාවන් තුළින් තම වෙළෙඳපොල පැවැත්ම ස්ථාවර කරගැනීමට කටයුතු කරමින් සිටියි. කෙසේ වුවද 2015 දී වැයකළහැකි ආදායම ඉහළ අගයක පැවතියද කාලයක සිට රක්ෂණ ආවරණ ලබාගැනීමේ අනුපාතිකය 1% ක් ලෙස පැවතිණි. මෙම අනුපාතිකය ආසියානු කලාපීය සාමාන්‍යය වූ 5.4% හා ගෝලීය සාමාන්‍යය වූ 6% ට සාපේක්ෂව අඩු අගයක පවතී. ජනතාව තුළ පවත්නා රක්ෂණය පිළිබඳ අනවබෝධය රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය වළක්වන සාධකයක් වී ඇත. ඒ නිසා රක්ෂණ කර්මාන්තය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුග්‍රහය ද ඇතිව අනාගතයේදී සතුටුදායක ප්‍රතිඵල ලබාගැනීමේ අරමුණින් ජනතාව තුළ රක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්බව වැඩි කිරීමට කටයුතු කරමින් සිටී.

නියාමන රාමුව

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් හඳුන්වා දුන් නව නීති රෙගුලාසි හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමන රාමුව තවත් තීව්‍ර වී ඇත. 2011 අංක 03 දරන රක්ෂණ සමාගම් පනතට අනුකූලව, 2015 ආරම්භයේ සංයුක්ත රක්ෂණ සමාගම් ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ලෙස බෙදා වෙන්කලයුතු විය. මෙමගින් රක්ෂණ ක්ෂේත්‍රයේ විනිවිදභාවය හා ආයතනික යහපාලනයේ වර්ධනයත් පාරිභෝගික අවශ්‍යතා ඉතාමත් හොඳින් ඉටුවීමත් පාරිභෝගිකයා ආරක්ෂාවීමත් අපේක්ෂාකරනු ලබයි. HNB ඇෂුවරන්ස් සමාගම ඇතුළුව බහුතරයක් රක්ෂණ සමාගම්, විවිධ අභියෝග වලට මුහුණ දෙමින් අදාළ කාර්යය සාර්ථක ලෙස නිම කොට ඇත. එනමුත් එක් මහා පරිමාණ රක්ෂණ සමාගමක් ඇතුළුව තවත් රක්ෂණ සමාගම් කිහිපයක් මෙම ක්‍රියාවලිය නිමකිරීමට අසමත් ව ඇත. මෙය කාරණා කොට ගෙන රක්ෂණ ක්ෂේත්‍රයේ විනිවිදභාවය හා සමානාත්මතාවයකින් යුතුව තරඟ කිරීමේ අරමුණ යටපත් වන අතර, මෙය මේ වනවිටත් විවිධ ගැටලු රැසකට මුහුණදෙමින් විශාල පිරිවැයක් දරමින් අදාළ නීතිමය රාමුව අනුගමනය කළ සමාගම් වලට ද අවාසි සහගත තත්වයක් උදාකරයි.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් රක්ෂණ කර්මාන්තයේ නුබන්වත් ආන්තික න්‍යාය (Solvency Margin Rules) වෙනුවට හඳුන්වා දුන් අවදානම මත පදනම් වූ ප්‍රාග්ධන ක්‍රියාරාමුව (Risk based capital framework) 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වනු ඇත. මෙමගින් සමාගම් වල ප්‍රාග්ධන මට්ටමේ ප්‍රමාණාත්මක භාවය නිරීක්ෂණ ක්‍රියාදාම ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. සෑම රක්ෂණ සමාගමක් විසින්ම මෙම නීතිමය අවශ්‍යතාව ඒකාකාරීව ක්‍රියාත්මක වීම අනිවාර්ය වේ. මෙහිදී අප සමාගම මෙහි පූර්ව පෙරහුරුව සඳහා වර්ෂ දෙකක් පුරා ක්‍රියාශීලීව සහභාගී වූ අතර එය ක්‍රියාවට නැංවීමට අදාළ වන වෙනස්කම් නියමිත කාලරාමුව තුළදී සාර්ථකව ක්‍රියාත්මක කළ බව සතුටින් ප්‍රකාශ කරමි.

සියළුම රක්ෂණ සමාගම් සඳහා තම ආයතන 2015 අවසානය වන විට ලැයිස්තුගත කිරීමට දෙන ලද කාලසීමාව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් දීර්ඝ කරන ලද අතර ඒ වෙනුවට වෙන්කිරීමේ කටයුත්ත සිදුකිරීමෙන් පසු ව්‍යාපාරය ආරම්භ කරන ලද දිනයේ සිට වසර තුනක් දක්වා කාළ සීමාවක් එම සමාගම් සඳහා ලබා දෙන ලදී. එමනිසා HNB ඇෂුවරන්ස් සමාගමට පූර්ණ අයිතිය පවත්නා පරිපාලිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම ලැයිස්තුගත කිරීමේ කටයුතු මෙම වසරේදී සිදු නොකළ නමුත් අවශ්‍ය නියමයන්ට අනුකූලව එම කටයුතු 2017 අවසානයට පෙර සිදු කරනු ඇත.

කාර්යය සාධනය

ජීවිත හා සාමාන්‍ය රක්ෂණ කටයුතු වෙන්ව සිදුකළ පළමු වර්ෂය වූ 2015 වසර දැඩි තරඟකාරී පරිසරයක් පැවති වසරකි. එනමුත් අප සමාගම රු. බිලියන 5.4 ක සමස්ථ රක්ෂණ වාරික ආදායමක් වාර්තා කිරීමට සමත් වූයේ පෙර වර්ෂයේ වාර්තාකල රු. බිලියන 4.6 ට වඩා 17% ක වර්ධනයක්ද සනිටුහන් කරමිනි. ජීවිත රක්ෂණ අංශය 19% ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 2.8 ක රක්ෂණ වාරික අදායමක් ලඟා කරගෙන ඇත . තවද මෙම රක්ෂණ වාරික ආදායමේ වර්ධන වේගය පෙර වර්ෂයේ වේගයට වඩා 3% කින් වැඩි කරගනිමින් සමස්ථ රක්ෂණ කර්මාන්තයේ ජීවිත රක්ෂණ වාරික අදායම් වර්ධන වේගය හා සම මට්ටමක පවත්වාගෙන ඇත.

අප සමාගම පරිත්‍යාග ජීවිත රක්ෂණ (Endowment Business) කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමුකරන අතර එම කටයුතු මගින් ජීවිත රක්ෂණ වාරික අදායමට 83% ක දායකත්වයක් ලබාගැනීමට සමත් විය. තවද නව රක්ෂණ කටයුතු (New Business) වල 32% ක වර්ධනයක් වාර්තා කිරීම ඉතා දිරිගන්වන සුළු වන අතර එමගින් අනාගත පසු වාරික (Renewal Business) වල වර්ධනයට මග පාදනු ඇත. වාරික රඳවාගැනීමේ අනුපාතය (Persistency Ratio) 2015 වර්ෂය අවසානය වනවිට 83% ක් දක්වා වර්ධනය කරගැනීමට සමත්ව ඇත.

මෙම සුභදායී කාර්යය සාධනය හේතුවෙන් රක්ෂණ ඔප්පු හිමිකරුවන්ගේ අරමුදල 27% කින් වර්ධනය වී ඇති අතර පසුගිය වසරේ වාර්තා වූ රු. මිලියන 228 ට සාපේක්ෂව රු. මිලියන 310 ක අතිරික්තයක් වාර්තා කිරීමෙන් පසුවද රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදල රු. බිලියන 6.9 ක අගයකට ළඟා වී තිබේ. මෙම ප්‍රවණතා හේතුවෙන් සමාගමේ පූර්ණ වත්කම් (Total Assests) රු. බිලියන 11.6 ක් දක්වා වැඩි කරමින් පළමුවන වරට ඉලක්කම් දෙකේ අගයකට ළඟා වෙමින් 2014 වර්ෂයට සාපේක්ෂව සමස්ථ වත්කම් වල 17% ක වේගයක් වාර්තාකරමින්

වර්ධනයක් පෙන්නුම් කර ඇත. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම රක්ෂණ කර්මාන්තයට වඩා තරමක් ඉහළ වර්ධන වේගයක් වාර්තාකරමින් 16% වර්ධනයක් පෙන්නුම් කළේය . අප සමාගමේ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනය මෙම කර්මාන්තයේ වර්ධනයට වඩා වැඩි වුවද සමාගම විසින් පෙර වසරේදී ළඟා කරගත් වර්ධනයට වඩා 9% ක අඩුවෙන් වාර්තාකරගෙන ඇත. හිමිකම් කීමේ අනුපාතය (Claims Ratio) 2015 අවසානය වන විට 88% ක අනුපාතයක් වාර්තා කරන අතර එය ඇස්තමේන්තු ගත අනුපාතය වූ 65% අභිබවා ගොස් ඇත.

සතුටුදායී ප්‍රවනතා කිහිපයක් මධ්‍යයේ වුවද අප සමූහයේ ලාභදායීත්වය වසර ගණනාවක කාර්යය සාධනය සමඟ සන්සන්දනය කිරීමේදී මධ්‍යස්ත මට්ටමක පැවති අතර එයට ප්‍රධාන හේතුව වන්නේ අප පරිපාලිත සමාගම වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි කාර්යය සාධනය අපේක්ෂිත මට්ටමේ නොතිබීමයි. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි අලාභ ලැබීම, නව වෙළෙඳපොළට පිවිසී වාහන පන්ති හා අලුත් වැඩියා කිරිම සඳහා වන අධික වියදමත් නිසා සිදුවිය. සමූහයේ සමස්ථ ප්‍රතිඵලය කෙරෙහි මෙය අහිතකර ලෙස බලපා තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය සමග 2016 වර්ෂයේදී සුභවාදී කාර්ය සාධනයක් තහවුරු කිරීම සඳහා 2015 අවසන් කාර්තුවේ සිට අධීක්ෂණ යාන්ත්‍රණය ශක්තිමත් කරන අතරම මෙම ප්‍රවණතාව ආපසු හැරවීම සම්බන්ධයෙන් ද විවිධ පියවර ගෙන ඇත.

## ලාභාංශය

2015 වර්ෂයේ කාර්ය සාධනය සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රථම හා අවසාන ලාභාංශ ලෙස කොටසකට රු.2.00 ක් ප්‍රදානය කිරීමට යෝජනා කර ඇත.

## ආයතනික සමාජීය වගකීම

අඛණ්ඩව මෙම වර්ෂය තුලදීත් ජල පහසුකම් නොමැති දුෂ්කර පළාත් පාසල් වලට ජලය සැපයීමේ වැඩසටහන යටතේ තවත් පාසල් දෙකකට ජල පහසුකම් ලබා දීම සිදු කෙරිණ. 2008 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ මේ දක්වා ව්‍යාපෘති 36 ක් සාර්ථකව නිම කරමින් මෙම වසරේදීත් මල් මඩුව හා කිඹිස්ස යන ප්‍රදේශවල පාසල් දෙකක් සඳහා ජල පහසුකම් සපයා දෙන ලදී. තෙවනවරටත් "පාසලෙන් කාර්යාලයට" (S2O) යන වැඩසටහන මගින් පාසල් අධ්‍යාපනය අවසන් කල සිසුදරුවන් පිරිසකට සංකීර්ණ කාර්යාල ජීවිතය තුල සාර්ථකව ඉදිරියට යාමට අවශ්‍ය මූලික නිපුණතා ලබාදීමේ කාර්යය ඉටු කෙරිණි. ඒ අතරින් පුහුණුව සහ හැකියාව මත සිසුදරුවන් කිහිපදෙනෙක් සඳහා අප සමාගමේ රැකියා අවස්ථා ලබාදීමද සිදු කෙරිනි.

මීගමුව රෝහලේ ලේ බැංකුව සඳහා මූලාධාර ලබාදීම, අනාථ දරුවන් සඳහා ත්‍යාග ලබාදීම, දෘශ්‍යාබාධිත කාන්තාවන් සඳහා සුදු සැරයටි ලබාදීම වැනි විවිධ වූ සමාජ සත්කාර කටයුතු තුළින් සමාජ වගකීම ඉටුකිරීමේ කටයුතු කිහිපයක්ම සිදුකරන ලදී.

## ගෞරව සම්මාන

වසර 14 ක කාලසීමාව තුළ සමාගම දේශිය හා විදේශිය ගෞරව සම්මානයන්ට පාත්‍ර වෙමින් විශිෂ්ට කාර්යය සාධනයක් ලබා ඇත. මෙම වර්ෂය තුලදීත් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් මෙහෙයවන ලද පනස් එක්වන වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදාන උලෙළේදී රක්ෂණ අංශයේ විශිෂ්ඨතම වාර්ෂික වාර්තාව සඳහා වූ රන් සම්මානයද තෙවනවරටත් අඛන්ඩව දිනා ගත්තෙමු. තවද විශිෂ්ට වාර්ෂික වාර්තා සඳහා වූ (SAFA) සම්මාන උලෙළේදී රක්ෂණ අංශයේ විශිෂ්ඨතම වාර්ෂික වාර්තාව සඳහා වූ රිදී සම්මානයත් ආයතනික යහ පාලනය පිළිබඳ හෙළිදරව් කිරීම් සඳහා කුසලතා ඇගයීමක්, S.L.I.T.A.D. සම්මාන ප්‍රදානෝත්සවයේදී පුද්ගල සංවර්ධනය සඳහා රජත සම්මානයද ශ්‍රී ලංකා ඉස්ලාමීය බැංකු හා මූල්‍ය ක්ෂේත්‍ර සම්මාන ප්‍රදානෝත්සවයේදී ඒකාබද්ධ ඉස්ලාමීය මූල්‍ය ආයතනය සඳහා වූ රජත සම්මානයද දිනාගැනීමට අපට හැකි විය.

එමෙන්ම ලංකා මන්ත්ලි ඩයිජෙස්ට් (LMD) විසින් තෝරා නම් කරනු ලැබ ඇති ශ්‍රී ලංකාවේ ඉහළම සමාගම් සියය අතර රැඳීසිටිමින් 98 වන ස්ථාන සිට 91 වන ස්ථානය දක්වා තම ස්ථානය වර්ධනය කරගැනීමටත් අප සමාගම සමත් වී ඇත.

අනාගත දැක්ම

HNB ඇෂුවරන්ස් සමාගම ජීවිත රක්ෂණ සේවා සපයන්නෙකු ලෙස කේන්ද්‍ර ගත වෙමින් කෙටිකාලයක් තුළ ලංකාවේ විශාලත්වයෙන් හයවන ස්ථානයේ සිය ස්ථාවරය තහවුරු කරගැනීමට සමත් විය. ජීවිත රක්ෂණ සමාගමක් ලෙස සිය වර්ධන වේගය තිව්‍ර කරගනිමින් නුදුරු අනාගතයේදී රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළ ස්ථානයක් අත්කරගැනීම ආයතනයේ අභිලාෂය වී තිබේ. ඉහත අරමුණු සාක්‍ෂාත් කරගැනීම සඳහා කළමනාකරණ මඩුල්ල විසින් සකස්කරන ලද අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් අනුමත කරන වසර 03 ක උපාය මාර්ගික සැලසුමක් 2016 වසරේ සිට ක්‍රියාත්මක වනු ඇත. මේ අතරින් ප්‍රමුඛ උපාය මාර්ගයන් වන්නේ වෙළඳපොළ අවස්ථා මගින් උපරිම ඵල නෙලා ගැනීමත්, මව් සමාගම සමග ශක්තිමත් සබඳතාවයන් ඇතිකරගැනීම මගින් එනම් Bancassurance අංශ හරහා වෙළඳපොළ අවස්ථාවලින් උපරිම ඵල ප්‍රයෝජන ලබාගැනීමට කටයුතු කිරීමයි.

වර්තමානයේ පවතින සැලසුම් හා ඉතුරුම් සැලසුම් තුලින් ස්වශක්තිය ඇති පුද්ගලයින් බිහිකිරීම සඳහා ඇති උනන්දුව උපයෝගීකරගෙන සමාගමේ සේවා කළඹ යලි අධ්‍යයනය කිරීමත් නව්‍යතා හඳුන්වාදීමත් තුලින් ජනතාවගේ මූල්‍යමය ආරක්ෂාව රක්ෂණය මගින් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරමු.

පාලිත සමාගම වන HNB ජෙනරල් සීමාසහිත සමාගමේ හි ප්‍රධාන අරමුණ වනු ඇත්තේ සියලුම අංශ වල ලාභදායිත්වය ඇතිකරගැනීමයි. පාරිභෝගික කාණ්ඩ මිල , අවදානම් හදුනාගැනීම , සේවාවන් හි වර්ධනය , ආයුගණක යෙදවුම් ඵලදායී අයුරින් යොදාගැනීම වැනි උපායමාර්ග දැනටමත් ක්‍රියාවට නංවා ඇති අතර ඒවා ක්‍රියාවට නැංවීමත් නිරීක්ෂණය කිරීමත් නිරතුරුව සිදුකෙරේ.

මෙරට තුල අපගේ ව්‍යාප්තිය වැඩිකිරීම සඳහා අප විසින් අභ්‍යන්තර (Organic) හා බාහිර (Inorganic) වර්ධන උපාය මාර්ග උපයෝගී කරගැනීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් බලාපොරොත්තුවේ.

මෙම සැලසුම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අනුකමිටු වල කාර්යයභාරයන් තවත් පුළුල් කර ප්‍රතිව්‍යුහගත කර ඇත. තවද උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීමට නව අනුකමිටුවක් පත් කර ඇත.

කෘතඥතාව පළකිරීම

ආචාර්ය රාණි ජයමහ මහත්මිය වසර තුනක සේවාවකින් පසු 2015 මාර්තු 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලයෙහි සභාපතිධූරයෙන් ඉල්ලා අස්වූ අතර එම කාලසීමාව තුළ සමාගම වෙනුවෙන් එතුමිය ලබාදුන් නායකත්වය සහ මඟපෙන්වීම වෙනුවෙන් ස්තුතිය පළ කරමි.

මංජුල ද සිල්වා මහතා 2015 මාර්තු 31 දින සිට කළමනාකරණ අධ්‍යක්‍ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ධූරයෙන් ඉල්ලා අස්වූ අතර වසර 11 ක් තුළ අප සමාගම රක්ෂණ ක්ෂේත්‍රයෙහි ප්‍රධාන සමාගමක් බවට පත්කරලීමට ලබාදුන් නායකත්වය සහ කැපවීම වෙනුවෙන් ස්තුතිය පළ කරමි.

2015 අප්‍රේල් 01 දින සිට 2015 ජූලි මස දක්වා සමාගමේ වැඩබලන සභාපතිවරයා ලෙස කටයුතු කළ ඉන්පසු අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජික තනතුර හෙබවූ ජොනතන් අලස් මහතා HNB බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීම මගින් බැංකුව තවත් ඉහළ තලයට ගෙනයාමේ අභිලාෂයෙන් 2015 දෙසැම්බර් 03 වනදා අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්විය. වසර ගණනාවක් පුරා HNB ඇෂුවරන්ස් ආයතනයට ලබාදුන් වටිනා සේවාව වෙනුවෙන් ඔහුටද මාගේ ස්තුතිය පිරිනමමි.

වසර 11 ක් තුළ විවිධ වූ පරාසයන්හි දී සමාගමට අගනා සේවයක් හා මගපෙන්වීමක් කරමින් සමාගමේ අධ්‍යක්‍ෂවරයෙකු වශයෙන් කටයුතු කර 2016 ජනවාරි 08 දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ඉල්ලා වූ උපාලි ද සිල්වා මහතාටද මාගේ ස්තුතිය පිරිනමමි.

එමෙන්ම HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ අධ්‍යක්‍ෂකවරයෙකු වශයෙන් කටයුතු කළ 2015 ඔක්තෝම්බර් 10 දින සිට අධ්‍යක්‍ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වූ ප්‍රතාප් කුමාර් ද සිල්වා මහතාටද ඔහු ලබාදුන් සේවය වෙනුවෙන් ස්තුතිය පළකිරීමට කැමැත්තෙමි.

සමාගම වෙනුවෙන් ඉහත අධ්‍යක්ෂකවරුන් ලබාදුන් වටිනා සහයෝගය සහ මගපෙන්වීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ස්තුතිය පළ කරමි.

<u>පත්වීම්</u>

තිමල් පෙරේරා මහතා HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ හී අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් 2015 දෙසැම්බර් 21 දින සිට ද HNB ඇෂුවරන්ස් හී අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් 2016 ජනවාරි 08 දින සිට ද අධ්‍යක්ෂමණ්ඩලයට එක්විය. දැනට තිමල් පෙරේරා මහතා HNB සමාගමේ පාරිභෝගික - සුළු හා මධ්‍ය පරිමාණ බැංකුකරණ අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයා වශයෙන් කටයුතුකරමින් සිටී. දේශිය - විදේශිය බැංකු ක්ෂේත්‍රය පිළිබඳ එතුමන් තුළ පවත්නා හසළ දැනුම සළකා බලන විට මව් සමාගම සමග ඒකාබද්ධව කටයුතුකිරීම සම්බන්ධයෙන් සමාගමේ කටයුතු සඳහා එතුමන් විසින් විශේෂ දායකත්වයක් ලබා දෙනු ඇතැයි මම විශ්වාස කරන අතර අධ්‍යක්ෂ මණ්ඩලයන්ට එක්වූ එම මහතා සුහදව පිළිගනිමි .

HNB ඇෂුවරන්ස් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන ඩිල්ශාන් රොඩ්රිගෝ මහතා 2015 දෙසැම්බර් 21 වනදා සිට HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයටද සම්බන්ධවූ අතර ඔහු ආයතන දෙකම නියෝජනය කිරීම තුලින් සමාගම් අතර අන්තර් සබඳතා වඩාත් ශක්තිමත් වනු ඇත.

<u>අගය කිරීම</u>

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමිය, අධ්‍යක්ෂ ජෙනරාල්තුමිය, සහ අනෙකුත් නිලධාරීන් 2015 වර්ෂය තුලදී මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් අඛණ්ඩව සහාය දැක්වීම පිළිබඳව ඔවුන්ට ස්තුති කිරීමට කැමැත්තෙමි. කර්මාන්තයේ වැඩි දියුණුව උදෙසා කර්මාන්තය හා බැඳී කටයුතු කරන රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඉටු කරන ලද කාර්යභාරයද අගය කරමි.

වර්ෂය මුළුල්ලේම දැක්වූ විශිෂ්ට සහාය, මාර්ගෝපදේශකත්වය හා සාමූහිකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික භවතුන්ට ද මාගේ ස්තුතිය පළ කරන අතර කළමණාකරණ මට්ටමේ නිලධාරීන්ද අනා කාර්යය මණ්ඩල සාමාජිකයන්ද වර්ෂය තුලදී ලබාදුන් කැපවීම මාගේ ප්‍රසාදයට ලක් වන බව ප්‍රකාශ කරමි.

එසේම අප වෙත තබා ඇති විශ්වාසය වෙනුවෙන් අපගේ පාර්ශවකරුවන්ට මගේ ස්තුතිය පිරිනමන අතර ඉහළ ප්‍රමිතියක් සහිත ආයතනික යහපාලනයක් හා ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කරමින් තිරසාර පදනමක් මත සමාගමේ සියලුම පාර්ශවකරුවන් වෙත වැඩි වටිනාකමක් නිර්මාණය කර දීමට 2016 වර්ෂයේදී ද අප සමාගම කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඔබට සහතික වෙමි.

රෝස් කුරේ
සභාපතිතුමිය
2016 පෙබරවාරි 09

පහත සඳහන් ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණය වාර්ෂික වාර්තාවේ පිටු අංක 21 - 25 හි ඇති ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණයේ පරිවර්තනයක් පමණි.

## ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විවරණය

2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා අපගේ වාර්ෂික වාර්තාව ඔබට ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි. තරඟකාරී සහ අභියෝගාත්මක වෙළඳපොළ පරිසරයක අපගේ සියළු ක්‍රියාකාරකම් සංක්ෂිප්ත කරමින් සංකලිත වාර්තාවක් අප ඉදිරිපත් කරන හතරවන අවස්ථාවය මෙයයි. පසුගිය වසර තුන සඳහා වූ අපගේ සංකලිත වාර්තාවන් වාර්තාකරණයේ ඉහළම ප්‍රමිතියක් සහිත වාර්තා ලෙස දේශීය සහ ජාත්‍යන්තර තලයේ පිළිගැනීමට ලක් වූ අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වන ලද වාර්ෂික වාර්තා සම්මාන උලෙළේදී රක්ෂණ ක්ෂේත්‍රය සඳහා වූ රන් සම්මානය ඇතුළු තවත් සම්මාන කිහිපයක් වසර තුනක් අඛණ්ඩව දිනා ගැනීමට අපට හැකි විය. මෙම වසරේදී ද අපගේ ගමන් මඟ සියළු පාර්ශවකරුවන් අතර බෙදා ගැනීමට අප නැවත වතාවක් උත්සාහ කර ඇත.

<u>රක්ෂණ වෙළෙඳපොළ</u>

සියළුම රක්ෂණ සමාගම් වලට තම ව්‍යාපාරය "ජීවිත" සහ "සාමාන්‍ය රක්ෂණ" ලෙස වෙන් කිරීම තුළ නියාමන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සිදු වීමත්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කරන මෙහෙයුම් නිර්ණායක වලට අනුගත විය යුතුය යන නියමයත් සහිතව නව වසර ආරම්භ විය. එම වෙන් කිරීමේ ක්‍රියාවලිය අනුව යමින් වර්තමානයේ සමාගම් 15 ක් ජීවිත රක්ෂණ සම්බන්ධයෙන් ද සමාගම් 16 ක් සාමාන්‍ය රක්ෂණ සම්බන්ධයෙන්ද ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටියි.

ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් ව්‍යාප්ත වීමේ අඩු මට්ටමක පවතින බැවින් තවදුරටත් පුළුල් වීමේ හැකියාවක් පවතී. රක්ෂණ වෙළඳපොළ ,ඒකාබද්ධ මට්ටමේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් 1% ක සීමාවට මදක් ඉහළින් පිහිටි අතර 2015 වසරේදී මධ්‍යස්ථ මට්ටමක වර්ධනයක් පෙන්වන ලදී. ජීවිත රක්ෂණ වල වර්ධනය 20% ක් සහ සාමාන්‍ය රක්ෂණ වල වර්ධනය 15% ක් සහිතව රක්ෂණ ක්ෂේත්‍රයේ ඒකාබද්ධ වර්ධනය 17% කි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ තිබෙන දැඩි මිල තරඟකාරිත්වය සහ රක්ෂණ කර්මාන්තය විසින් ජීවිත රක්ෂණ වල වටිනාකම පිළිබඳව අවධාරණය කිරීමට ගත් සියළු උත්සාහයන් හමුවේ වුවත්, තම අනාගත මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ජීවිත රක්ෂණය පිළිගැනීමට සාමාන්‍ය ජනතාව තුළ ඇති පැකිළීම මෙම මධ්‍යස්ථ වර්ධනයට හේතු ලෙස දැක්විය හැකිය.

<u>කණ්ඩායමේ සමස්ථ කාර්ය සාධනය</u>

HNB ඇෂුවරන්ස් සමාගම ජීවිත රක්ෂණ කටයුතු වෙනුවෙන් සහ එහි 100% ක් හිමිකම් කියන පරිපාලිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු කරන වෙනුවෙනුත් අපගේ ව්‍යාපාරය සාර්ථකව වෙන් කරමින් අපි වසර ආරම්භ කළෙමු. ප්‍රශස්ථ ආයතනික ව්‍යුහයන් වැඩිදියුණු කරමින් සහ විවිධ කාර්යයන් සඳහා පුද්ගලයන් වෙන් කරමින් ක්‍රියාත්මක කළ වෙන්කිරීම 2014 වසරේදී සිදු කළ අතර, ආයතන දෙකම තම ව්‍යාපාර දියුණු කිරීම සම්බන්ධයෙන් යොමු වී සිටීම තුළ, වෙන් කරන ලද පරිසරය වෙත සංක්‍රමණය වීම ඉතා සුමට ආකාරයට සිදුවිය. මේ නිසා අප සමූහය 2014 වසරට සාපේක්ෂව 17% ක වර්ධනයක් පෙන්නුම් කරමින් රු. බිලියන 5.4 ක වාරික ආදායමක් ලබා ගැනීමට හැකි විය.

සමාලෝචනය කරන ලද වසර තුළ සමූහය (Group) රු. මිලියන 197 ක බදුවලින් පසු ආදායමක් වාර්තා කළ අතර එය පසුගිය වසරවල් සමඟ සැසඳීමේදී වාර්ෂික ලාභ වල අඩු වීමකි. ජීවිත රක්ෂණ ව්‍යාපාරය රු. මිලියන 428 ක සතුටුදායක ලාභයක් ලබාගත් අතර එය 2014 වසර සමඟ සැසඳීමේදී 88% ක වර්ධනයක් වූ අතර පරිපාලිත සමාගමවූ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ අලාභයන් නිසා HNB ඇෂුවරන්ස් සමූහයේ සමස්ථ කාර්ය සාධනය පහළ බැසීමක් සිදුවිය.

කෙසේවෙතත් HNB ඇෂුවරන්ස් සමාගම සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම 2016 සිට ඉදිරි අවදානම් පදනම් කරගත් ප්‍රාග්ධන රාමුව යටතේ හඳුන්වාදෙනු ලබන අනාගත ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය සහ වර්තමාන නුබුන්වත් අවශ්‍යතා සපුරාලමින් ශක්තිමත් ප්‍රාග්ධනිත සමාගම් ලෙස පවතියි. තවදුරටත් ෆිච් රේටිං ලංකා සීමාසහිත සමාගම (Fitch Ratings Lanka Limited), රක්ෂණ මූල්‍ය ඇගයීම් සහ ජාතික දිගු කාළීන ඇගයීම් වලදී සමාගම් දෙකටම "ඒ ශ්‍රේණියේ" ස්ථාවර දර්ශනයක් තවත් වසරක් සඳහා ලබා දීමෙන් සමාගම් දෙකෙහි ශක්තිය නැවත සහතික කර ඇත. එසේම අඛණ්ඩව අටවන වසරටත් "ඒ" ශ්‍රේණිය ලබා ගැනීමට හැකිවීම සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙමු.

<u>ජීවිත රක්ෂණ ව්‍යාපාරය</u>

ජීවිත රක්ෂණ ව්‍යාපාරයේ කාර්ය සාධනය ප්‍රශංසනීය වන අතර ඉතාමත් අභියෝගාත්මක ව්‍යාපාර වාතාවරණයක් තුළ රු. බිලියන 2.7 ක වාරික ආදායමක් ලබා ගනිමින් 19% ක් වර්ධනයක් ලබා ගෙන ඇත. මෙම වර්ධනයට ප්‍රධාන දායකත්වය ලබා දී ඇත්තේ පරිත්‍යාග (Endowment) ජීවිත රක්ෂණ ඔප්පුහී 25% ක සැළකිය යුතු වර්ධනයයි. අපගේ ප්‍රධාන පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු දෙකක් වන්නේ "මයි ෆන්ඩ්" (My Fund) සහ "රන්මඟ" (Ranmaga) ජීවිත රක්ෂණ ඔප්පු වන අතර ඒවා වසර පුරා අලෙවියේ විශාල වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර වර්ධනය සඳහා සැළකිය යුතු දායකත්වයක් දක්වා තිබේ. ලාභය සළකා බැලුවිටද ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ මෙම වර්ධනය ඉතාමත් දිරිගන්වනසුළු වන අතර, ක්‍රමික වාරික පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු සමාගමට දිගු කාළීනව වැඩි අගයක් ලබා දෙයි. එම හේතුවෙන් අපගේ දීර්ඝකාළීන

ක්‍රමෝපායික සැළසුම් ආයෝජන අරමුණු කරගත් රක්ෂණ ඔප්පු ක්‍රමයෙන් අඩු කරමින් අපගේ ව්‍යාපාර සමූහය වාරික පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පු වැඩි දියුණු කිරීම වෙත යොමු වි ඇත.

අඩු පොළී පරිසරයක් තුළ නිවාස ණය අංශයේ වැඩි ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබෙන අතර එතුළින් අපගේ උකස් අවම කිරීමේ රක්ෂණ ඔප්පු ප්‍රචලිත කිරිමේ වැඩි අවස්ථාවක් අපට ලැබුනි. එතුළින් එම ප්‍රභේදයෙහි 52% ක සැළකිය යුතු ආදායම් වර්ධනයක් ඇති වී තිබේ.

රක්ෂණ ඔප්පුවේ පළමු වසර තුළ ඔප්පුව අකර්මණ්‍ය වීම ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ අවධානයට ලක් වී ඇති කාරණයකි. මෙය හමුවේ අපගේ කාර්යසාධනය වැඩි කිරීමේ ක්‍රමවේදයක් ලෙස ගෙවීම් අධීක්ෂණ කිරීමේ  යාන්ත්‍රණයක් හඳුන්වාදී ඇති අතර  වැඩිදියුණු කරන ලද අධීක්ෂණ ක්‍රමවේදය තුළින් පළමු වසර තුළ රක්ෂණ ඔප්පු අකර්මණ්‍ය වීමේ ප්‍රමාණය 3% කින් අඩු කර ගැනීමට අපට හැකි වී තිබේ. මෙමඟින් අපගේ රඳවාගැනීමේ අනුපාතය වැඩි දියුණු වීම පමණක් නොව වාරික අලුත් කිරීමේ අනුපාතය ද වැඩි වීමට හේතු වී ඇති අතර එමඟින් අපගේ සමස්ථ ආදායම වැඩිවීම ද සිදුවී තිබේ.

මෙම ජයග්‍රහණ වලට සමාන්තරව මෙම වසරේදී සමාගමට “මිලියන් ඩොලර් රවුන්ඩ් ටේබල්” (Million Round Table) ජයග්‍රාහකයින් 14 ක්  බිහි කිරීමට හැකි වි ඇති අතර එය 2014 වසරේ බිහි කළ ජයග්‍රාහකයන් 4 දෙනාට සාපේක්ෂව සැළකිය යුතු වර්ධනයකි. මෙම ජාත්‍යන්තර පිළිගැනීම ලබා ගැනීම ජීවිත රක්ෂණ අලෙවි ප්‍රචාරක වෘත්තියේ උච්ඡතම අවස්ථාවක් වන අතර මෙම වසරේ නව ජයග්‍රාහකයන් 10 ක් බිහිකරමින් අලෙවි කරුවන්ගේ කාර්ය සාධනය ගෝලීය සැසඳුම් මට්ටම දක්වා වර්ධනය කිරීමටත්, ඒ  සමඟම ඔවුන්ට  තම පෞද්ගලික ජීවිතවල ඉහළ තත්වයන් කරා ළඟා වීමට සහාය දීමටත් කළමනාකාරිත්ව කණ්ඩායම ගන්නා දැඩි උත්සාහය මනාවට පැහැදිලි කරයි.

වසර අවසන් වන විට  තක්සේරුවට අනුව ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තය අවශ්‍ය සංචිත ප්‍රමාණය ට වඩා රු. මිලියන 476 කින් වැඩි වී තිබේ. එයින් රු. මිලියන 86 ක් ප්‍රසාද දීමනා වශයෙන් ජීවිත රක්ෂණ ඔප්පු හිමියන් අතර බෙදා දීමද රු. මිලියන 310 ක් කොටස්හිමිකරුවන්ගේ අරමුදලට මාරු කිරීම ද සිදු කරන ලදී. එසේම ලාභාංශ පදනම් කරගත් රක්ෂණ ඔප්පු වලට 7.5% ක් ලාභාංශ වශයෙන් ලබා දී තිබෙන අතර ලාභ සහිත රක්ෂණ ඔප්පු සඳහා රක්ෂණය කරන ලද රු.1,000 කට රු.54/- ක වැඩිම ප්‍රසාද දීමනාවක් ලබා දී තිබේ.

ව්‍යාපාරයේ වර්ධනය නිසා ජීවිත රක්ෂණ අරමුදල රු. බිලියන 6.9 කට ළඟා වෙමින් 27% කින් වර්ධනය වූ අතර කොටස් හිමිකරුවන්ගේ අරමුදලට ලබාදුන් අතිරික්තය 36%  කින් වැඩි විය. මෙය 2014  දී 26% ක් විය.

## ආයෝජන

දේශපාලනික සහ සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවන් නිසා පොළී අනුපාත වල, විදේශ විනිමය සහ ප්‍රාග්ධන වෙළඳපොළෙහි උච්චාවචන සිදු විය. මෙම අසීරු වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ අප සමූහයෙහි මව් සමාගම වන HNB ඇෂුවරන්ස් සමාගම හරහා ආයෝජන ආදායම ලෙස රු. මිලියන 729 ක්ද පරිපාලිත සමාගම වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම හරහා රු. මිලියන 189 ක්ද වශයෙන් සමස්ත ව්‍යාපාරයෙහි ආයෝජන අදායම රු. මිලියන 918 ක් වාර්තා කර තිබේ. ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්ට අදාළව සාමාන්‍ය ආයෝජන ආදායම වශයෙන් 10.1% ක් වාර්තා කරමින් වසරක් සඳහා වන අවදානම් නිදහස් අනුපාතය වන 6.6% ට වඩා ඉහළින් තම සමාන්‍ය ආයෝජන අදායම පවත්වාගැනීමට අප සමූහයට හැකි වී තිබේ. වසරේ අවසාන භාගයේ අපේක්ෂිත පොළී අනුපාත දැඩි ලෙස ඉහළ යාම සහ වසර මුළ භාගය තුළ පැවති පොළී අනුපාත වල උච්චාවචනය නිසා එම අවස්ථාව විචක්ෂණ ලෙස ප්‍රයෝජනයට ගනිමින් රජයේ සුරැකුම්පත් වලින් රු. මිලියන 15.7 ක ලාභයක් ලබා ගැනීමටත් ණයකර වලින් රු. මිලියන 12.6 ක ලාභයක් ලබා ගැනීමටත් අප සමූහයට හැකි විය. තව දුරටත් රුපියලේ අගය දැඩි ලෙස පහළ යාමක් අපේක්ෂාවෙන් විදේශ මුදල් ආයෝජන නිවැරදි ලෙස කළමනාරකණය කිරීමෙන් රු. මිලියන 12 ක උපලබ්ධි නොවූ ලාභයක් වාර්තා කිරීමට සමාගමට හැකි විය. දුෂ්කර මෙහෙයුම් පරිසරයක් තුළ සමූහයේ සමස්ථ ආදායම් තත්ත්වයට ආයෝජන අදායම දැක්වූ දායකත්වය අභ්‍යන්තර කළමනාකරණ කණ්ඩායමේ ප්‍රශංසනීය කාර්ය සාධනයකි.

## පරිපාලිත වාර්තාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

උග්‍ර මිල තරඟයක් මධ්‍යයේ අප සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රු. බිලියන 2.7 ක වාරික ආදායමක් වාර්තා කර ඇත. මෙය පසු ගිය වසරට සාපේක්ෂව 16% ක වර්ධනයක් වූ අතර එහි මෝටර් වාහන රක්ෂණය රු. බිලියන 2 ක මූලික දායකත්වයක් දක්වමින් ආදායමේ 76% කට දායකත්වය සපයා ඇත. ගිනි හා ඉංජිනේරු පංති රු. මිලියන 372 ක වාරික ආදායමක් වාර්තා කරමින් මෙම සමූහයට 14% දායකත්වයක් ලබා දී තිබේ. සමුද්‍ර රක්ෂණය 6% ක ආන්තික වර්ධනයක් වාර්තා කළ අතර මෙම ක්ෂේත්‍රෙයේ තෝරාගත් ප්‍රාරක්ෂණ ව්‍යාපාර නිසා වෛද්‍ය වාරික 15% කින් අඩුවිය. අපගේ ටකාෆුල් රක්ෂණ අංශය (Takaful Insurance Window) රු. මිලියන 132 ක වාරික ආදායමක් වාර්තා කරමින් 57% ක අති විශිෂ්ට වර්ධනයක් වාර්තා කර තිබේ.

මෙම අංශය තවදුටත් ශක්තිමත් කරමින් පවතින අතර විශේෂයෙන්ම නැගෙනහිර පළාතේ මෙම අංශයේ ව්‍යාපාර මෙහෙයුම් පුළුල් කිරීම තුළින් 2016 වසරේ මෙහි වර්ධනය කඩිනම් කිරීමට සැළසුම් සකස් කර තිබේ.

මෝටර් වාහන රක්ෂණ වන්දි ඉහළ යාම හේතුවෙන් මෙම වසර තුළ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ රක්ෂණ හිමිකම් පෑමේ දළ අනුපාතය 88% ක් දක්වා ඉහළ යන ලදී. පෞද්ගලික නොවන මෝටර් රථ අංශයේ යහපත් කාර්ය සාධනය හිලව් කරමින් පෞද්ගලික මෝටර් රථ අංශයේ අලාභ වසර පුරා දැඩි ලෙස වර්ධනය විය. මෙම වසර තුළ රක්ෂණ හිමිකම්පෑම් අනුපාතය (Claims Ratio) වර්ධනය වීමට හේතු වූයේ රුපියල අවප්‍රමාණය වීමෙන් මෝටර් රථ අමතර කොටස් මිල ඉහල යාමත්, හදිසි අනතුරු ශීඝ්‍ර ලෙස වර්ධනය වීමත්, වෙළෙඳපොල පවතින තරඟකාරී මිලගණනුත්ය.

රක්ෂණ හිමිකම්පෑම් අනුපාතයේ (Claims Ratio) වැඩි වීමක් සිදුවුනද අමතරව වියදම් පාලනය කිරීමටත් පසුගිය වසරේ තිබූ වියදම් අනුපාතය (Expense Ratio) වන 38% ට සාපේක්ෂව වියදම් අනුපාතය 35% දක්වා අඩු කිරීමටත් අපට හැකි විය. කෙසේ වෙතත් වැඩිවූ හිමිකම්පෑම් අනුපාතය නිසා ඒකාබද්ධ අනුපාතය (Combined Ratio) 2014 තිබූ 110% ට වෙනුවට 123% ක් දක්වා වර්ධනය වීම සිදුවිය.

සමාලෝචනයට ලක්වන වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ආයෝජන ආදායම් ප්‍රතිලාභ, වෙළඳපොළ කාර්ය සාධනයට වඩා යහපත් විය. එහෙත් සිත් ගන්නා සුළු ආයෝජන ප්‍රතිලාභ තුළින් ප්‍රාරක්ෂණ හානි නිෂේධ කළ නොහැකි වූ අතර එනිසා HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම 2015 මෙහෙයුම් වර්ෂය සඳහා රු. මිලියන 227 ක අලාභයක් වාර්තා කොට ඇත.

ලාභදායිත්ව වැඩි කිරීමේ විශේෂ අරමුණ සහිතව ව්‍යාපාරයේ සමස්ථ කාර්ය සාධනය වැඩි කිරීමට ක්‍රමෝපායන් ලෙස අප සමාගම සාමාන්‍ය රක්ෂණ අංශය සඳහා මෝටර් වාහන අංශයට ආයුගණක (Actuarial) සහාය සහිත මිලකරණ ජාලයක් හඳුන්වා දීම තුලින් වාහන වර්ගය/වටිනාකම/ මාධ්‍ය පදනම් කරගත් මිල අවදානම් ගණනය කිරීම, මෝටර් වාහන නොවන අංශය සුරක්ෂිත කිරීමට වැඩි අවදානයක් දැක්වීම, පාඩු ලබන ගිණුම් නැවත අලුත් නොකිරීම ආදිය ඇතුළත් ක්‍රියාකාරි සැළසුමක් සකස් කර ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව ලාභදායීත්වය වැඩි දියුණු කිරීමේ ප්‍රධාන පරමාර්ථය සහිතව අපගේ ක්‍රමෝපායී සබදතාවයන් තව දුරටත් වැඩි දියුණු කිරීම සඳහා නැවත සාකච්ජා කිරීමක් ද සිදුකොට ඇත.

අපගේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවන්ට නිසි අවධානය යොමු කරමින් හිමිකම් පෑම් සම්බන්ධ වියදම් අවම කිරීම වෙනුවෙන් වඩා සක්‍රීය ප්‍රවේශයක් උපයෝජනය කර ගැනීම සඳහා හිමිකම් ඇගයීම් සහ අදාළ ක්‍රියාවලිය අනුකූලනය කිරීම තුළින් රක්ෂණ හිමිකම් පෑම් කළමනාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කර ඇත.

සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර යේ ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීමේ ක්‍රමයක් වශයෙන් මව් සමාගම වන HNB ඇෂුවරන්ස් සමාගම 2015 නොවැම්බර් මාසයේ නව ප්‍රාග්ධනය ලෙස රු. මිලියන 150 ක් ලබා දී ඇත. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ නුබුන්වත් මට්ටම (Solvency Ratio) මෙමගින් ඉහළ ගොස් තිබේ.

<u>ආයතනික යහපාලනය</u>

සියළුම නියාමන අවශ්‍යතා කාළීනව සිදුකිරීම තුලින් හා අඛණ්ඩව ව්‍යාපාර ආචාර ධර්ම හා වටිනාකම් පවත්වාගැනීම් තුළින් අප සමාගම සමාගම් සංස්ථා පාලනයේ ඉහළ ප්‍රමිතියක් අඛණ්ඩව පවත්වාගෙන තිබේ. සමාගමේ සභාපතිවරයා සහ පාලක මණ්ඩලය සමාගම විසින් වසර පුරා මෙම යහපුරුදු පවත්වාගන යන බවට තහවුරු කරති.

HNB ඇෂුවරන්ස් සීමාසහිත සමාගමේ සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගම යන සමාගම් දෙකෙහිම සභාපතිත්වය දැරූ ආචාර්ය රාණි ජයමහ මැතිණිය 2015 මාර්තු 30 දින තනතුරින් ඉල්ලා අස්විය. එතුමියගේ කාළසීමාව තුළ එතුමිය විසින් දෙන ලද සහාය සහ මග පෙන්වීම වෙනුවෙන් මම එතුමියට ස්තුතිවන්ත වෙමි. රෝස් කුරේ මහත්මිය HNB ඇෂුවරන්ස්හි සභාපතිනිය ලෙස 2015 ජූලි 06 දින පාලක මණ්ඩලයට සම්බන්ධ වූ අතර පසුව HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ සභාපතිනිය ලෙස පත්වූවාය. මම එතුමියව ඉතාමත් උණුසුම් ලෙස පිළිගන්නා අතර එතුමිය විවිධ ක්ෂේත්‍රවලින් උකහාගත් දැනුම් සම්භාරය තුළින් තීක්ෂණ ලෙස අප සමූහය ඉහළට ඔසවා තබමින් අප සමාගමට ඉමහත් ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

HNB ඇෂුවරන්ස් සමාගමේ සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ මංජුල සිල්වා මහතා 2015 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් ඉවත් විය. වසර 11 ක සේවා කාලය තුළ ශක්තිමත් සමාගමක් ගොඩනැගිම සඳහා එතුමාගේ කැපවීම සහ දායකත්වය වෙනුවෙන් මගේ අවංක ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි.

2015 අප්‍රේල් මස සිට ජූලි මස දක්වා වැඩබලන සභාපති ලෙස කටයුතු කළ ජොනතන් අලස් මහතා 2015 දෙසැම්බර් 03 සිට ක්‍රියාත්මක වන පරිදි HNB ඇෂුවරන්ස් සමාගමේ සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ පාලක මණ්ඩල වල සේවයෙන් ඉවත් විය. එතුමා ලබා දුන් මිල කළ නොහැකි සහාය සහ මගපෙන්වීම සම්බන්ධයෙන් මම එතුමාට ස්තුති කරමි. නව සීමාවන් ගවේෂණය කිරීම සහ සාමූහිකත්ව සමාගම් සමූහය තුළ ඇතිකිරීමට මූලාරම්භයන් ඇති කිරීමට එතුමා කළ කාර්යභාරය ඉතාමත් අගය කළ යුතු කාරණයකි.

HNB ඇෂුවරන්ස් සමාගමේ පාලක මණ්ඩලයෙන් උපාලි ද සිල්වා මහතා 2016 ජනවාරි 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් ඉවත් විය. වසර ගණනාවක් පුරා මෙම ව්‍යාපාරය සංවර්ධනය කිරීම සඳහා ලබා දුන් මගපෙන්වීම සහ ප්‍රතිවේදයන් සම්බන්ධයෙන් මම එතුමාට මගේ කෘතඥතාව පළ කරමි.

තිමාල් පෙරේරා මහතා HNB ඇෂුවරන්ස් සමාගමේ සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල වලට පිළවෙලින් 2016 ජනවාරි 08 සහ 2015 දෙසැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්බන්ධ විය. මම එතුමන් ඉතාමත් උණුසුම් ලෙස පිළිගන්නා අතර එච් එන් බී සමූහය තුළ තිබෙන සමාගම් එකට සම්බන්ධ කිරීමට එතුමා දක්වන දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරමි.

2015 දෙසැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඩිල්ශාන් රොඩ්රිගෝ මහතා HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීම තුළ එම ආයතනය තව දුරටත් ශක්තිමත් වී තිබේ. එතුමා HNB ඇෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද සේවය කරමින් පවතී.

ප්‍රතාප්කුමාර් ද සිල්වා මහතා HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් 2015 ඔක්තෝබර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය. වසර ගණනාවක් තිස්සේ එතුමා ලබා දුන් ඉමහත් දායකත්වය සම්බන්ධයෙන් මම එතුමාට ස්තුතිවන්ත වන අතර ඉදිරි වසර සඳහා එතුමාට යහපත් සෞඛ්‍ය සහ සතුට ප්‍රාර්ථනා කරමි.

<u>ඇගයීම</u>

මට සහ මගේ කණ්ඩායමට ලබා දුන් සහාය සහ ධෛර්යය වෙනුවෙන් මගේ අවංක ඇගයීම සභාපතිතුමියට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දීමට මම අපේක්ෂා කරමි. එසේම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි සභාපතිවරියට ද අධ්‍යක්ෂ ජෙනරාල්වරියට ද එහි කාර්ය මණ්ඩලයට ද ඔවුන් ලබා දුන් සහාය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. මෙම වසර තුළ මෙම සමාගම ඉදිරියට මෙහෙයවීම සඳහා මට ලබා දුන් අඛණ්ඩ සහාය වෙනුවෙන් විධායක සභා සාමාජිකයන්ට, අංශ ප්‍රධානීන්ට, කළමනාකරුවන්ට, කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා රක්ෂණ අලෙවිකරුවන්ට මාගේ විශේෂ ස්තුතිය හිමිවේ. HNB ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා වල කාර්ය මණ්ඩලයට මගේ කණ්ඩායමට ලබා දුන් අඛණ්ඩ සහාය දැඩි ලෙස අගය කරමින් මාගේ ස්තුතිය පළ කරමි. එසේම අප කණ්ඩායම සමඟ සියළුම තැරැව්කරුවන්ට, ප්‍රතිරක්ෂකයන්ට, අතරමැදියන්ට, ජාල සහ ක්‍රමෝපායික පාර්ශ්වකරුවන්ට ඔවුන් ලබා දුන් සහාය සම්බන්ධයෙන් සහ අපගේ ප්‍රගතියට ලබා දුන් සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පුද කරමි.

<u>අනාගත වර්ධනය හා ඉදිරි දැක්ම</u>

නවෂ්තා සම්පාදනය කරන ආයතන සඳහා බොහෝ වර්ධන අවස්ථා සහිතව රක්ෂණ පරිසරය තරඟකාරී එහෙත් ස්ථාවර මට්ටමක පවතිනු ඇත. ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපොළ සම්බන්ධයෙන් ධනාත්මක අදහස් දක්වමින් ෆිච් රේටින්ස් (Fitch Ratings) විසින් නිකුත් කරන ලද නවතම වාර්තාවේ මෙය තවදුරටත් තහවුරු කර තිබේ. මෙම වසරේදී අපගේ අරමුණ වන්නේ නව නිෂ්පාදන හා අපගේ පවතින නිෂ්පාදන වලට වටිනාකම් එකතු කිරීමින් අසමසම සහ ආකර්ෂණීය යෝජනා සැළසුම් ඉදිරිපත් කිරීම තුළ අපගේ ව්‍යාපාරය වර්ධනය කිරීමයි.

අපගේ ව්‍යාප්තිය රට පුරා නොනැවතී වර්ධනය කර ගැනීම සඳහා වන මූලික ක්‍රමෝපායක් වශයෙන් අපගේ ශාඛා ජාලය සහ සේවක කණ්ඩායම් තෝරාගත් ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම අපගේ අරමුණ වේ. ඒ සමඟම අපගේ ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධවන අවස්ථා වඩවඩාත් නිර්මාණය කර ගැනීම අපගේ ව්‍යාපාරය සඳහා ඉතාමත් ම වැදගත් වන අතර අපගේ ප්‍රතිරූපය සහ වෘත්තීයවේදීත්වය වැඩිදියුනු කිරීම වෙත වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වෙමු. අපගේ බැංකු හරහා කරන රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් හැටන් නැෂනල් බැංකුව ලබා දෙන සහාය අපගේ ව්‍යාපාරයට ඉමහත් ශක්තියකි. විවිධත්වයෙන් යුතු ගණුදෙනුකාර පදනමක් වෙත අපගේ නිෂ්පාදන සහ සේවා සැපයීමේ අවස්ථාවන් සූක්ෂම ලෙස ප්‍රයෝජනයට ගනිමින් සමූහය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මෙම සබඳතාව අඛණ්ඩව පෝෂණය කෙරෙනු ඇත.

අවදානම මත පදනම් වූ ක්‍රියාරාමුව (Risk Based Capital) ක්‍රියාත්මක පරිසරයක් යටතේ, පෙර පැවති නුහුරුන්වත් සීමා රීති ක්‍රියාත්මක පරිසරයකට වඩා ප්‍රාග්ධන කළමණාකරණයට හා ක්‍රියාරාමුවට අනුකූල නව සේවාවන් හඳුන්වාදීම වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කෙරේ. ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය ශක්තිමත්ව පවත්වා ගැනීම සහ මනා ලෙස නිර්මාණය කල සේවා හරහා ලාභදායීත්වයත්වය වැඩි දියුණු කර ගැනීමේ අරමුණ ඇතිව අපගේ ආයතනයේ ආයුගණක (Actuarial) කණ්ඩායම අප සේවා ලබා ගන්නා බාහිර ආයුගණක (Actuarial) කණ්ඩායම සමඟ අඛණ්ඩව කටයුතු කරගෙන යනු ඇත.

පාරිභෝගිකයන්ගේ විශ්වාසය රකින සහ ඔවුන් ආරක්ෂා කරන ආයතනයන් වශයෙන් HNB ඇෂුවරන්ස් සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සන්නාම නාමයන් තවදුරත් ශක්තිමත් කිරීමට අප කටයුතු කරමු. මේ සඳහා ගෝලීය වශයෙන් පිළිගත් ක්‍රමවේදයන් දැනටමත් අපගේ ක්‍රියාවලියට යොදාගෙන ඇත.
අභ්‍යන්තර (Organic) ක්‍රමවේදයන් හරහා කඩිනම් වර්ධනයක් හඹා යන අතරම අපගේ සියලු පාර්ශ්වකරුවන්ට වැඩි වටිනාකමක් ලබාදීමේ අරමුණින් බාහිර (Inorganic) ක්‍රමවේදයන් හරහා අපගේ ව්‍යාපාර පුළුල් කිරීමේ අවස්ථා සෙවීමේ කටයුතු අඛණ්ඩව කරගෙන යනු ඇත.

එමෙන්ම ගෝලීය පිළිගනීමක් ඇති තාක්ෂණික පාර්ශ්වකරුවන් සහ ආයෝජකයින් සමඟ ක්‍රමෝපායික සබඳතා ගොඩනගා ගැනීම අප අඛණ්ඩව කරගෙනයන අතර මෙමගින් ජාත්‍යන්තර මට්ටමේ නිර්ණායකයන් හඳුන්වාදීමෙන් අපගේ වටිනා ගණුදෙනුකරුවන්ට සේවාවන් උසස් තත්වයෙන් සැපයීමට කටයුතු කරමු.

අපගේ පරිපාලිත සමාගම වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් අලාභ අවම කරගැනීමට හඳුන්වා දී ඇති පියවර සූක්ෂම ලෙස නිරන්තර පරික්ෂාවට ලක්වනු ඇති අතර මේ නිසා කළමණාකාරී කණ්ඩායමේ වැඩි අවධානයක් ඒ වෙනුවෙන් ලබාදෙනු ඇත. ප්‍රධාන වෙනස්කම් ලෙස අපගේ ව්‍යාපාර සංකලනය හා ව්‍යාපාර අංශ වෙනස්කිරීම සඳහා අවධානය යොමුකරමින් දැනටමත් හඳුන්වා දී ඇති සැලසුම් දැක්විය හැකි අතර මෙම වෙනස්කම් වල ප්‍රතිලාභ 2016 වසර තුල දැක ගැනීමට හැකිවනු ඇත.

වාරික හා ලාභාදයිත්වය අඛණ්ඩව වර්ධනය කරගැනීම අතින් රක්ෂණ ක්ෂේත්‍රයේ පෙරමුණෙහි සිටින HNB ඇෂුවරන්ස් ආයතනය කෙටිකාල සීමාවක් තුලදී 6 වැනි විශාලතම ජීවිත රක්ෂණ සමාගම බවට පත්ව ඇති අතර 2015 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහාද විශිෂ්ට කාර්යසාධනයක් නැවතත් පෙන්නුම් කර ඇත. 2016 වසරේ ක්‍රියාත්මක කිරීමට සුදානම්කර ඇති සැලසුම් පෙර පරිදිම ආරක්ෂණ ඔප්පු අලෙවිය වැඩි කර ගැනීම මත පදනම් වනු ඇත

ජීවිත රක්ෂණ අංශය වෙනුවෙන් 2016 වසරේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති සහ දැනට ක්‍රියාත්මක වන සැළසුම් තුළින් ආරක්ෂණ ඔප්පු අලෙවිය සඳහා වසර ගණනක් තිස්සේ ගොඩනැගී ඇති මනා අඩිතාලම තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් සීමාසහිත සමාගමේ දුර්වල ප්‍රතිඵල සමූහයේ ලාභදායිත්වයට සෘණ බලපෑමක් ඇති කළද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දිශානතිය වෙනස් කිරීමට ගත් මූලාරම්භයන් නිසා මෙම පරිපාලිත සමාගමටද අනාගතයේදී අප සමූහයට තිරසාර වටිනාකමක් ගොඩනැගීම සඳහා ප්‍රබල ලෙස දායකත්වය ලබා දීමට හැකියාව ලැබෙනු ඇතැයි මගේ විශ්වාසයයි.

නිරන්ජන් මාණික්කම්
ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)

2016 පෙබරවාරි 09

# HNB ඇෂුවරන්ස් PLC
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට, | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 136,279 | 133,942 | 94,107 | 133,942 |
| අස්පෘෂ්‍ය වත්කම් | 45,185 | 51,622 | 45,185 | 51,622 |
| විලම්භිත බදු වත්කම් | 49,394 | - | - | - |
| මූල්‍ය ආයෝජන | 9,751,611 | 8,277,895 | 7,849,625 | 8,171,269 |
| ආයෝජන - පාලිත සමාගම | - | - | 1,150,000 | 100,000 |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය | 91,992 | 71,082 | 91,992 | 71,082 |
| ලැබිය යුතු ප්‍රති රක්ෂණ | 141,354 | 162,260 | 34,269 | 162,260 |
| ලැබිය යුතු රක්ෂණ වාරික | 345,916 | 364,051 | 5,592 | 364,051 |
| වෙනත් වත්කම් | 625,985 | 683,149 | 493,571 | 682,639 |
| රක්ෂණ ගිවිසුම් – විලම්භිත වියදම් | 65,935 | 52,072 | - | 52,072 |
| මුදල් සහ මුදල් සමානතා | 386,929 | 173,245 | 258,222 | 171,217 |
| **මුළු වත්කම්** | **11,640,580** | **9,969,318** | **10,022,563** | **9,960,154** |
| | | | | |
| **හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | | | | |
| **මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 1,171,875 | 1,171,875 | 1,171,875 | 1,171,875 |
| රඳවාගත් ඉපැයීම් | 1,174,262 | 1,196,546 | 1,397,806 | 1,189,039 |
| විකිණීම සඳහා වර්ගීකරණය කරන ලද ආයෝජනයන්හි සංචිත | (4,748) | 3,590 | 53 | 3,523 |
| වෙනත් සංචිත | (1,093) | 1,177 | (2,039) | 1,177 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | (56,350) | 40,748 | (56,350) | 40,748 |
| මව් සමාගමේ මුළු හිමිකරු ප්‍රාග්ධනය | 2,283,946 | 2,413,936 | 2,511,345 | 2,406,362 |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | 2,283,946 | 2,413,936 | 2,511,345 | 2,406,362 |
| | | | | |
| **වගකීම්** | | | | |
| රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත රක්ෂණ | 7,007,080 | 5,562,648 | 7,007,080 | 5,562,648 |
| රක්ෂණ ප්‍රතිපාදන - සාමාන්‍ය රක්ෂණ | 1,546,265 | 1,279,138 | - | 1,279,138 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | 81,001 | 71,493 | 44,008 | 71,493 |
| වර්තමාන බදු වගකීම | - | 12,012 | - | 10,422 |
| විලම්භිත බදු වගකීම | - | 8,845 | - | 8,845 |
| ගෙවිය යුතු ප්‍රති රක්ෂණ | 131,905 | 110,778 | 37,547 | 110,778 |
| වෙනත් වගකීම් | 590,383 | 510,468 | 422,583 | 510,468 |
| **මුළු වගකීම්** | 9,356,634 | 7,555,382 | 7,511,218 | 7,553,792 |
| | | | | |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය සහ වගකීම්** | **11,640,580** | **9,969,318** | **10,022,563** | **9,960,154** |

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 238 හී ඇති විගණනය කරන ලද මූල්‍ය තත්ව ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC
## ලාභාලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා, | සමූහය | | සමාගම | | වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2014 | 2015 | 2014 | සමූහය | සමාගම * |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | | |
| දළ ලේඛනගත රක්ෂණ වාරික | 5,447,164 | 4,665,618 | 2,788,716 | 4,665,618 | 17 | 17 |
| ප්‍රති රක්ෂකයන්ට කැපකළ වාරික | (599,084) | (601,022) | (107,963) | (601,022) | - | - |
| ශුද්ධ ලේඛනගත රක්ෂණ වාරික | 4,848,080 | 4,064,596 | 2,680,753 | 4,064,596 | 19 | 19 |
| නොඉපැයූ රක්ෂණ වාරිකවල සංචිතයේ ශුද්ධ වෙනස | (122,677) | (219,086) | - | (219,086) | (44) | (44) |
| **ඉපැයූ ශුද්ධ රක්ෂණ වාරික** | **4,725,403** | **3,845,510** | **2,680,753** | **3,845,510** | **23** | **23** |
| **වෙනත් ආදායම්** | | | | | | |
| පොළී හා ලාභාංශ ආදායම | 871,049 | 824,015 | 705,571 | 816,876 | 6 | 7 |
| ශුද්ධ උපලබ්ධි ප්‍රතිලාභය | 30,025 | 108,823 | 22,512 | 105,785 | (72) | (72) |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභය | 16,583 | 99,281 | 4,028 | 99,281 | (83) | (83) |
| ගාස්තු සහ කොමිස් ආදායම් | 122,552 | 123,425 | 51,000 | 123,425 | (1) | (1) |
| වෙනත් ආදායම් | 8,943 | 12,366 | 15 | 12,366 | (28) | (28) |
| | **1,049,152** | **1,167,910** | **783,126** | **1,157,733** | **(10)** | **(9)** |
| **ශුද්ධ ආදායම** | **5,774,555** | **5,013,420** | **3,463,879** | **5,003,243** | **15** | **15** |
| **ශුද්ධ ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ ගෙවූ වන්දි | (1,984,358) | (1,528,233) | (299,271) | (1,528,233) | 30 | 30 |
| ශුද්ධ ගෙවියයුතු රක්ෂණ වන්දිවල වෙනස | (133,431) | (44,871) | 18,776 | (44,871) | 197 | 197 |
| ජීවිත රක්ෂණ සංචිතයේ ගිවිසුම්ගත වගකීම්හී වෙනස | (1,462,100) | (1,192,273) | (1,462,100) | (1,192,273) | 23 | 23 |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (1,363,757) | (1,303,710) | (735,521) | (1,303,130) | 5 | 5 |
| ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත්කරගැනීමේ වියදම් | (632,107) | (474,826) | (510,961) | (474,826) | 33 | 33 |
| වෙනත් රක්ෂණ අදාළ වියදම් | (29,029) | (30,924) | (17,774) | (30,924) | (6) | (6) |
| **මුළු ප්‍රතිලාභ, වන්දි සහ වියදම්** | (5,604,782) | (4,574,837) | (3,006,851) | (4,574,257) | 23 | 23 |
| **බදු පෙර ලාභය** | 169,773 | 438,583 | 457,028 | 428,986 | (61) | (60) |
| ආදායම් බදු | 27,571 | (20,857) | (29,383) | (19,267) | (232) | (243) |
| **වර්ෂය සඳහා වූ ලාභය** | **197,344** | **417,726** | **427,645** | **409,719** | **(53)** | **(52)** |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය කරන ලද හෝ වර්ගීකරණය වියහැකි අයිතම** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | (87,480) | 116,815 | (80,350) | 113,710 | (175) | (177) |
| - ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද උපලබ්ධි වූ ලාභය | (19,242) | (69,722) | (20,218) | (66,684) | (72) | (71) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | 97,098 | (44,930) | 97,098 | (44,930) | (316) | (316) |
| - ආශ්‍රිත බදු | 1,286 | - | - | - | - | - |
| **ලාභාලාභ සඳහා නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | | | | |
| ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | (2,270) | (995) | (3,216) | (995) | 128 | 128 |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම (බදු පසු)** | (10,608) | 1,168 | (6,686) | 1,101 | (1,008) | (1,063) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 186,736 | 418,894 | 420,959 | 410,820 | (55) | (55) |
| **මුළු ලාභය :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු ලාභය | 197,344 | 417,726 | - | - | (53) | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු ලාභය** | 197,344 | 417,726 | - | - | (53) | - |
| **මුළු විස්තීරණ ආදායම :** | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට ආදළ වර්ෂයේ මුළු විස්තීරණ ආදායම | 186,736 | 418,894 | - | - | (55) | - |
| පාලනයට නතුනොවන අයිතිය | - | - | - | - | - | - |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | 186,736 | 418,894 | - | - | (55) | - |
| **කොටසක ඉපයීම** | | | | | | |
| කොටසක ඉපයීම - මූලික (රු.) | 3.95 | 8.35 | 8.55 | 8.19 | (53) | (52) |
| කොටසක ලාභාංශය (රු.) | - | - | 2.00 | 3.75 | - | - |

* ලකුණින් දක්වා ඇත්තේ 2015 **HNB** ඇෂුවරන්ස් සමූහයේ ප්‍රතිඵල සහ 2014 **HNB** ඇෂුවරන්ස් සමාගමේ හි ප්‍රතිඵල අතර සංසන්දනාත්මක වෙනසවේ.

ඉහත විස්තීරණ ආදායම් ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 239 හී ඇති විගණනය කරන ලද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමූහය

| 2015 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 1,171,875 | 941,820 | 1,427 | 2,172 | (4,182) | 2,113,112 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| - වර්ෂය සඳහා වු ලාභය | - | 417,726 | - | - | - | 417,726 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 47,093 | - | - | 47,093 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (44,930) | - | - | (44,930) |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (995) | - | (995) |
| වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම | - | - | 2,163 | (995) | - | 1,168 |
| වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම | - | 417,726 | 2,163 | (995) | - | 418,894 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 44,930 | 44,930 |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **- ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| - 2013 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (162,500) | - | - | - | (162,500) |
| - පාලිත සමාගමේ කොටස් නිකුතුවට අදාළ ගණුදෙනු සඳහා වියදම | - | (500) | - | - | - | (500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (163,000) | - | - | 44,930 | (118,070) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | **1,171,875** | **1,196,546** | **3,590** | **1,177** | **40,748** | 2,413,936 |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 1,196,546 | 3,590 | 1,177 | 40,748 | 2,413,936 |
| සුපිරි ලාභ බදු | - | (31,378) | - | - | - | (31,378) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 197,344 | - | - | - | 197,344 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (105,436) | - | - | (105,436) |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 97,098 | - | - | 97,098 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් | - | - | - | (2,270) | - | (2,270) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (8,338) | (2,270) | - | (10,608) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 197,344 | (8,338) | (2,270) | - | 186,736 |
| ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (97,098) | (97,098) |
| **හිමිකරුවන් සමඟ සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2014 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (187,500) | - | - | - | (187,500) |
| පාලිත සමාගමේ කොටස් නිකුතුවට අදාළ ගණුදෙනු සඳහා වියදම | - | (750) | - | - | - | (750) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (188,250) | - | - | (97,098) | (285,348) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,174,262 | (4,748) | (1,093) | (56,350) | 2,283,946 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 240 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය - සමාගම

| 2015 දෙසැම්බර් 31 න් අවසන් වු වර්ෂය සඳහා, | ප්‍රකාශිත ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයීම් | අලෙවිය සඳහා පවතින සංචිත | වෙනත් සංචිත | ජීවිත රක්ෂණ හිමියන්ගේ ආදායම් සංචිතය | මුළු ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 941,820 | 1,427 | 2,172 | (4,182) | 2,113,112 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 409,719 | - | - | - | 409,719 |
| **වර්ෂය සඳහා වු වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 47,026 | - | - | 47,026 |
| - ජීවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (44,930) | - | - | (44,930) |
| - ප්‍රතිමිනුම් මත ලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරිම් | - | - | - | (995) | - | (995) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | 2,096 | (995) | - | 1,101 |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 409,719 | 2,096 | (995) | - | 410,820 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | 44,930 | 44,930 |
| හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු | | | | | | |
| ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම් | | | | | | |
| 2013 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (162,500) | - | - | - | (162,500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (162,500) | - | - | 44,930 | (117,570) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,189,039 | 3,523 | 1,177 | 40,748 | 2,406,362 |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 1,171,875 | 1,189,039 | 3,523 | 1,177 | 40,748 | 2,406,362 |
| සුපිරි ලාභ බදු | - | (31,378) | - | - | - | (31,378) |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | | | | | |
| වර්ෂය සඳහා වු ලාභය | - | 427,645 | - | - | - | 427,645 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | | |
| - විකිණීම සඳහා වර්ගීකරණය කළ මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | (100,568) | - | - | (100,568) |
| - ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිතයට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | 97,098 | - | - | 97,098 |
| - ප්‍රතිමිනුම් මත ලාභ/අලාභ - සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරිම් | - | - | - | (3,216) | - | (3,216) |
| **වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම** | - | - | (3,470) | (3,216) | - | (6,686) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | 427,645 | (3,470) | (3,216) | - | 420,959 |
| ජිවිත රක්ෂණ හිමියන්ගේ සංචිත අරමුදලට පවරන ලද විකිණීම සඳහා වර්ගීකරණය කළ ආයෝජනයන්හි ශුද්ධ සාධාරණ අගයේ වෙනස | - | - | - | - | (97,098) | (97,098) |
| **හිමිකරුවන් සමග සිදුවු, ස්කන්ධයේ සෘජුවම සටහන් කරන ලද ගනුදෙනු** | | | | | | |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද බෙදාහැරීම්** | | | | | | |
| 2014 වර්ෂය සඳහා වු ලාභාංශ ගෙවීම් | - | (187,500) | - | - | - | (187,500) |
| **ව්‍යාපාරයේ හිමිකරුවන්ට කරන ලද මුළු බෙදාහැරීම්** | - | (187,500) | - | - | (97,098) | (284,598) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,171,875 | 1,397,806 | 53 | (2,039) | (56,350) | 2,511,345 |

ඉහත හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 241 හී ඇති විගණනය කරන ලද හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.

# HNB ඇෂුවරන්ස් PLC

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | සමූහය | | සමාගම | |
|---|---|---|---|---|---|
| **දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,** | | 2015 | 2014 | 2015 | 2014 |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| බදු පෙර ලාභය | | 169,773 | 438,583 | 457,028 | 428,986 |
| **ගැලපීම්:** | | | | | |
| පොළී ආදායම | | (843,579) | (808,970) | (687,104) | (801,831) |
| ලාභාංශ ආදායම | | (27,470) | (15,045) | (18,467) | (15,045) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමාක්ෂය | | 17,226 | 17,975 | 17,226 | 17,975 |
| දේපල පිරියත හා උපකරණ ක්‍රමක්ෂය | | 51,116 | 40,330 | 38,082 | 40,330 |
| සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් | | 22,201 | 19,050 | 12,849 | 19,050 |
| ශුද්ධ සාධාරණ අගය මත ලාභ | | (16,583) | (99,281) | (4,028) | (99,281) |
| උපලබ්ධි වූ ශුද්ධ ලාභ | | (30,025) | (108,823) | (22,512) | (105,785) |
| වත්කම් පැවරීම මත උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ | | (3,523) | - | (3,523) | - |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් (ලාභය)/අලාභය | | (46) | 174 | (15) | 174 |
| | | (660,910) | (516,007) | (210,464) | (515,427) |
| මෙහෙයුම් වත්කම් වල වෙනස | (අ) | 65,699 | (299,620) | (24,825) | (299,110) |
| මෙහෙයුම් වගකීම් වල වෙනස | (ආ) | 1,812,602 | 1,608,263 | 1,533,751 | 1,608,263 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ | | 1,217,391 | 792,636 | 1,298,462 | 793,726 |
| ගෙවූ පාරිතෝශිකය | | (14,963) | (5,189) | (11,292) | (5,189) |
| ගෙවූ ආදායම් බදු | | (1,280) | - | - | - |
| ගෙවූ සුපිරි ලාභ බදු | | (31,378) | - | (31,378) | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | | 1,169,770 | 787,447 | 1,255,792 | 788,537 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ආයෝජන සුරැකුම් ශුද්ධ මිලදී ගැනුම් | | (1,442,522) | (1,148,749) | (1,294,693) | (1,047,491) |
| ලද පොළී | | 711,684 | 591,459 | 568,571 | 586,583 |
| ලද ලාභාංශ | | 27,198 | 15,228 | 18,467 | 15,228 |
| ආයෝජන පාලිත සමාගම | | - | - | (150,000) | (100,000) |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනුම් | | (10,789) | (15,790) | (10,789) | (15,790) |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනුම් | | (53,596) | (37,747) | (39,679) | (37,747) |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් සඳහා ලද මුදල් | | 189 | 310 | 146 | 310 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (767,836) | (595,289) | (907,977) | (598,907) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලද මුදල් ප්‍රවාහ** | | | | | |
| ලාභාංශ ගෙවීම් | | (187,500) | (162,500) | (187,500) | (162,500) |
| කොටස් නිකුතුව හා සම්බන්ධ වියදම් - පාලිත සමාගම | | (750) | (500) | | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගත් ශුද්ධ මුදල් ප්‍රවාහ | | (188,250) | (163,000) | (187,500) | (162,500) |
| **මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම** | (ඇ) | 213,684 | 29,158 | 160,315 | 27,130 |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් | | 173,245 | 144,087 | 171,217 | 144,087 |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - පාලිත සමාගම | | - | - | (73,310) | - |
| **වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම්** | | 386,929 | 173,245 | 258,222 | 171,217 |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ සටහන්**

| | සමූහය 2015 | සමූහය 2014 | සමාගම 2015 | සමාගම 2014 |
|---|---|---|---|---|
| **(අ) මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | | |
| විලම්භිත වියදම් වල වැඩි වීම් | (13,863) | (19,160) | - | (19,160) |
| ජීවිත රක්ෂණ හිමියන්ට දී ඇති ණය වල වැඩි වීම් | (20,910) | (17,426) | (20,910) | (17,426) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වල (වැඩි වීම්) /අඩු වීම් | 20,906 | (56,870) | (10,823) | (56,870) |
| ලැබිය යුතු රක්ෂණ වාරිකයන්හී (වැඩි වීම්) /අඩු වීම් | 18,135 | (62,869) | 1,351 | (62,869) |
| මුළු වෙනත් වත්කම් වල (වැඩි වීම්) /අඩු වීම් | 61,431 | (143,295) | 5,557 | (142,785) |
| | 65,699 | (299,620) | (24,825) | (299,110) |
| **(ආ) මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | | |
| මුළු වගකීම් වල වැඩි වීම් | 79,916 | 116,172 | 82,693 | 116,172 |
| රක්ෂණ ප්‍රතිපාදන – සාමාන්‍ය රක්ෂණ වල වැඩි වීම් | 267,127 | 268,036 | - | 268,036 |
| රක්ෂණ ප්‍රතිපාදන – ජීවිත රක්ෂණ වල වැඩි වීම් | 1,444,432 | 1,214,158 | 1,444,432 | 1,214,158 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ – වැඩි වීම් | 21,127 | 9,897 | 6,626 | 9,897 |
| | 1,812,602 | 1,608,263 | 1,533,751 | 1,608,263 |
| **(ඇ) මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල වැඩි වීම්/(අඩු වීම්)** | | | | |
| වසර අවසානයේ මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 386,929 | 173,245 | 258,222 | 171,217 |
| අඩුකලා : වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ශුද්ධ අගය | 173,245 | 144,087 | 171,217 | 144,087 |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - සාමාන්‍ය රක්ෂණයට පැවරීම | - | - | (73,310) | - |
| වසර මුල මුදල් සහ මුදල් වලට සමාන වත්කම් - ජීවිත රක්ෂණ හා සාමාන්‍ය රක්ෂණ වෙන්කිරීමෙන් පසු | - | - | 97,907 | - |
| මුදල් සහ මුදල් වලට සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම් | 213,684 | 29,158 | 160,315 | 27,130 |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වාර්ෂික වාර්තාවේ පිටු අංක 242 හී ඇති විගණනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පරිවර්තනයක් පමණි.